මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ
දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

1. සම්බන්ධ වන ආයතන.

1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.
යොමු අංකය : CPC/PSC/COOpd/1/1/2/2/5/(i) දිනය : 2013.07.29

1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය.
යොමු අංකය : CPC/1/16/2/1 දිනය : 2013.08.07

1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය.
යොමු අංකය : CPC/PSC/2/3/බ.ගැ./C දිනය : 2013.08.12

1.4. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම.
යොමු අංකය : ඩීඑම්එස්/ඩී/පොදු/11-2 දිනය : 2012.12.19

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය.
යොමු අංකය :NPC/10/P/GE/SR/6 දිනය : 2014.04.25

2. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1. පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

3. සේවා ගණය පිළිබඳ විස්තර.

3.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - අධි පන්තිය
3.2. ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය
3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : සමුපකාර සමිති ප්‍රඥප්තිය, සමුපකාර සේවක කොමිෂන් සභා පනත, සමුපකාර රීති හා රෙගුලාසි, අති විශේෂ ගැසට් නිවේදන සහ බාහිර පනත් වලින් පැවරෙන බලය යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් / සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් පවරනු ලබන කාර්යයන් ඉටු කරනු ලබන සේවා ගණයකි.

4. පත්වීමේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

5. වැටුප් :
5.1. වැටුප් කේත අංකය : MN 7 - 2006 - A
5.2. වැටුප් පරිමාණය : රු. 20,030 - 11×365 - 18×500 - 33,045/-
5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ ශ්‍රේණිය | 04 | 21125/- |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

6. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි | විශේෂ ශ්‍රේණිය | 06 | සමූපකාර ප්‍රඥප්තිය, රීති රෙගුලාසි අනුව ඉටු කළ යුතු කාර්යන් සහ තනතුරට අදාළව සමූපකාර සංවර්ධන කොමසාරිස් / සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 06 යි.

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2. විවෘත බඳවා ගැනීම :අදාළ නොවේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම්:

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2. සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3. පළපුරුද්ද: සුදුසුකම් සලකා බලන දිනට මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන සමූපකාර සංවර්ධන නිලධාරි I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා I ශ්‍රේණියේ වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

7.4.2.4. කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
........2014-06-04........ දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.4.2.5. වෙනත් :

7.4.2.5.1. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.2.5.2. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.2.5.3. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලබන දිනට පෙරාතුව වූ වසර පහ(05) ක් තුළ සාමාන්‍ය මට්ටමට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

7.4.2.5.4. සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබිය යුතුය.

7.5. වයස:

7.5.1. අවම වයස් සීමාව : අදාළ නොවේ.

7.5.2. උපරිම වයස් සීමාව : අදාළ නොවේ.

7.6. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයැදුම්කරුවන් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

7.6.1. ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.6.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.6.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ. ( ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.)

7.6.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ. |
| වෘත්තීය සුදුසුකම් | 20 | |
| පළපුරුද්ද | 60 | |
| භාෂා ප්‍රවීණතාව | 05 | |
| සම්මුඛ පරීක්ෂණය | 05 | |

(ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම - 01)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.6.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.7. අයැදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් මගින්.

8. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම් : අදාළ නොවේ.

12. අර්ථ නිරූපණ හා නිර්වචන:-

12.1. "ආණ්ඩුකාරවරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

12.2. "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

12.3. "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් වරයා වේ.

12.4. "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි.

12.5. "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හා "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයායි.

12.6. " සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද , සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

12.7. " සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙක් සියලුම වැටුප් රහිත කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

13. අන්තර්ග්‍රහණය කිරීම : මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) මගින් ලබා දී ඇති MN 7 - 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් ලබමින් සිටින වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

I. අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරනු ලබන්නන් ආයතන ප්‍රධානියා මගින් (ඇමුණුම 02) හි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

II. ආයතන ප්‍රධානියා විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතුයි.

III. කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

IV. අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට විධිමත් පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියක් කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය/මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැනනගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. එස්.බී. බැද්දේවෙල මහතා | (සභාපති ) | ........................................ |
| 02. යූ.ජ්. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................................ |
| 03. ජී.ජී.එස්.ජ්. දිසානායක මිය | (සාමාජික) | ........................................ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................................ |
| 05. ජ්.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................................ |

දිනය 2014. 05. 27

ආණ්ඩුකාර ලේකම්,

2014. 05. 27 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 14/653 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2014. 05. 28

........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි.

අනුමත කරමි / නොකරමි

ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 14. 06. 04

........................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර

දිනය ..............................

ඇමුණුම 01

දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන නිලධාරි තනතුරට උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 10 යි<br>1.1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. | 10 | අදාළ නොවේ. |
| 2. වෘත්තීය සුදුසුකම්<br>2.1. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය විසින් පවත්වන ලද කළමනාකරණ/විගණන උසස් ඩිප්ලෝමාව සමත්ව තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව /ආර්ථික විද්‍යාව යන විෂයයන් පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්ව තිබීම. - ලකුණු 10 යි<br><br>2.2. දේශීය/විදේශීය පාඨමාලා - ලකුණු 10 යි<br>(බඳවා ගැනීමේදී සළකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම්වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව හදාරන ලද වෘත්තීය විෂයගත පාඨමාලා) (රාජ්‍ය ආයතන/NICD/විදේශීය ආයතන)<br><br>2.2.1. මාස 01 ට අඩු පාඨමාලාවකට - ලකුණු 02 යි<br>2.2.2. මාස 1 -3 ත් අතර පාඨමාලාවකට - ලකුණු 05 යි<br>2.2.3. මාස 3 -6 ත් අතර පාඨමාලාවකට - ලකුණු 08 යි<br>2.2.4. මාස 6 - වසර 1 ත් අතර පාඨමාලාවකට - ලකුණු10 යි | 20 | |
| 3. පළපුරුද්ද<br>3.1. මූලික සුදුසුකමක් ලෙස සලකන සමූපකාර සංවර්ධන නිලධාරි I ශ්‍රේණියේ වසර පහ (05) ඉක්මවූ පසු සම්පූර්ණ කළ සෑම වසරක් සඳහාම ලකුණු 05 බැගින් උපරිම වසර 06කට -ලකුණු 30 යි<br><br>3.2. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරි (අධි ශ්‍රේණියේ) වැඩ බැලීම / රාජකාරි ඉටුකිරීම සිදු කර ඇති නිලධාරීන්ට එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 03 කට (මාසයක කාලයක් සඳහා වුවද සමානුපාතිකව ලකුණු හිමි වේ.) -ලකුණු 30 යි | 60 | |
| 4. භාෂා ප්‍රවීණතාව<br>4.1. පිළිගත් ආයතනයක හදාරන ලද සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහා (උපරිම ලකුණු 05 යි)<br><br>4.1.1. ඩිප්ලෝමා - ලකුණු 05<br>4.1.2. සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 03 | 05 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා උපරිම -ලකුණු 05 යි<br>(නායකත්වය, පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා, ආකල්ප යනාදිය සළකා බලනු ලැබේ.) | 05 | |
| මුළු ලකුණු | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014-06-04 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 06

<u>මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ</u>
<u>දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>
<u>අනුව අන්තර්ග්‍රහණය කිරීමේ ඉල්ලුම් පත්‍රය</u>

I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. ස්ථානය සහ ලිපිනය : ..............................................................................................
.................................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම : .....................................................................................

.................................................................................................මෙනවිය/මහත්මිය/මහතා

3. (i) උපන්දිනය : ........................... (ii) පරිපාටිය ක්‍රියාත්මක වන දිනට වයස :..................

4. දැනට දරන තනතුර : .................................................................................................

5. පත්වීමේ ස්වභාවය : ...........................................

5.1 තනතුරට අදාළ මුල් පත්වීමේ දිනය හා ලිපියේ අංකය : ..........................................................

5.2 පත්වීම ස්ථිර කළ දිනය හා ලිපියේ අංකය :
...................................................................

5.3 වර්ෂ 1994 සිට පරිපාටිය ක්‍රියාත්මක වන දින දක්වා කාලය තුළ උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ පත්වීම් ලැබුවෙක්ද යන්න සඳහන් කරන්න
:.................................................................................................................................

5.4 ඉහත 5.3 පරිදි හැර වෙනත් ආකාරයකින් පත්වීම් ලැබුවන් නම් එහි ස්වභාවය සඳහන් කරන්න..........................................................................................................................

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව,

1. වැටුප් පරිමාණය : ..........................................

2. වැටුප් කේත අංකය : ..............................................

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,

1. වැටුප් පරිමාණය : ...............................................

2. වැටුප් කේත අංකය: .............................................

3. 2011.07.31 වැනි දිනට

(අ) වැටුප් තලය : රු .........................................

(ආ) වැටුප් පියවර අංකය : .......................................

8. දැනට සිටින තනතුරට බඳවාගැනීමේ පටිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................................................

9. රාජකාරී විස්තරය (සැකෙවින්) : ...................................................................................

.................................................................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන් :

| කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සමත් වූ දිනය |
|---|---|
| 1. ............................................ | ........................... |
| 2. ............................................ | ........................... |
| 3. ............................................ | ........................... |

11. සේවා කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සේවා කාලය | | තනතුර | ස්ථානය | කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| සිට | දක්වා | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : ..............................

...................................

අයදුම්කරුගේ අත්සන

2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.

13. අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර (අදාළ වේ නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කරමි) ඔහු/ඇය මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./ නොකරමි (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

දිනය................................ ....................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව.)

3 කොටස - මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා

14. අයැදුම්කරු / අයැදුම්කාරිය මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/ නොකරමි.
15.අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් ඊට හේතු :....................................................................
....................................................................................................................................
..................................................................................................................

16. අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය : ............................................

දිනය................................ ....................................................

බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-06-04 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම